ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# පුරප්පාඩු

## ලේකම් (කොන්ත්‍රාත් පදනම)

**දිනමිණ, තිනකරන් සහ ඩේලි නිව්ස්** පුවත්පත් තුළ ප්‍රකාශයට පත් කර ඇති 2025.10.23 දිනැති පුවත්පත් දැන්වීම ප්‍රකාරව, **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව** විසින් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් **ලේකම් (කොන්ත්‍රාත් පදනම ) තනතුර** සඳහා අයදුම්පත් කැඳවයි.

1. **සුදුසුකම් : (1 හෝ 2 හෝ 3)**

1. නීති/සමාජ විද්‍යා/කළමනාකරණ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් තිබීම හෝ නීතිඥවරයකු වීම

**සමඟ**

නීති/සමාජ විද්‍යා/කළමනාකරණ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් (ශාස්ත්‍රපති) හෝ පිළිගත් කළමනාකරණ ආයතනයක් සාමාජිකත්වය

**සහ**

අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර 20ක පළපුරුද්දක් සහ ඉන් වසර 05ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද, රාජ්‍ය හෝ පළාත් සේවය, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලය/ආයතනයක් හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක් තුළ විශ්වාසදායක සේවා ඉතිහාසයක් තිබීම.

2. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සහ**

වසර 15ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ, රාජ්‍ය හෝ පළාත් සේවය, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලය/ආයතනයක් හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක පළපුරුද්ද

3. නීති/සමාජ විද්‍යා/ කළමනාකරණ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් තිබීම හෝ නීතිඥවරයකු වීම

**සහ**

නීති/සමාජ විද්‍යා/ කළමනාකරණ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්

**සහ**

ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු අවම වසර 05ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද, රාජ්‍ය හෝ පළාත් සේවය, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලය/ආයතනයක් හෝ ප්‍රසිද්ධ වාණිජ ආයතනයක් තුළ විශ්වාසදායක සේවා ඉතිහාසයක් තිබීම.

**සටහන :මානව හිමිකම් ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත්භාවය විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.**

**2.** වැටුප : රු.161,140-12x 4,850-219,340 (HM 2-1-2025)

කළමණාකරන සේවා චක්‍රල්බ අංක 01/2025 අනුව 2025.01.01 දිනට අදාල මූලික වැටුප රු.119,494/= + ජීවන වියදම දීමනාව රු.17,800/=

(විශ්‍රාමික රජයේ නිලධාරීන් සඳහා වැටුප රා.ප.ච.ලේ. 03/2018 අනුව තීරණය කෙරේ.)

**3.** අනෙකුත් **:**

සියළු අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii.වයස අවුරුදු 35 ට නො අඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.(විශ්‍රාමික රජයේ නිලධාරීන් සඳහා වයස අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.)
iii. තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරිකව හා මානසිකව නීරෝගී විය යුතුය.
iv.යහපත් චරිතයක් තිබිය යුතුය.

**4.** **බඳවාගැනීමේ ක්‍රමය:**

පත්වීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් මඟින් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.

**5.** **සම්මුඛ පරීක්ෂණය:**

ලකුණු පහත පරිදි ලබා දෙනු ඇත:

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුදු | - | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| වෙනත් සුදුසුකම් | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

සම්මුඛ පරීක්ෂණයේ ලබාගන්නා ලකුණු මත පදනම්ව පමණක් බඳවාගැනීම සිදුකෙරෙයි.

**පොදු මාර්ගෝපදේශ**

1. පත්වීම ලබන පුද්ගලයින්හට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා හිමිකමක් ඇත.

2. දැනට රාජ්‍ය සේවයේ/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා හරහා අයදුම් කළ යුතු අතර, ආයතන ප්‍රධානියා විසින් ඔහු/ඇය මෙම තනතුරට තොරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශයක් ලබා දිය යුතුය.
3. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සහ ඒ අනුව කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
4. සුදුසුකම් සහ අත්දැකීම් පෙන්වීමට අයදුම්පත සමග සහතිකපත්‍රවල සහතික කළ ඡායාපිටපත් අමුණා එවිය යුතුය.
5. අයදුම්කරුවකු සුදුසු අයදුම්කරුවකු වන්නේ අයදුම්පත් අවසන් දිනට පෙර අවශ්‍ය සුදුසුකම් සපුරා ඇතිනම් පමණයි.
6. පත්වීම් බලධාරීන් වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ කොමිෂන් සභාවයි.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් සියලු විස්තර ඇතුළත් ජීව දත්ත පත්‍රයක් සමඟ අයදුම්පත්, ඥාති නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නිර්දේශ සඳහන් කරමින්, "**සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2025.11.10** වන දිනට පෙර යොමු කළ යුතුය. අයදුම්පත අඩංගු තැපැල් ඇසුරුමේ වම්පස ඉහළ කෙළවරේ, **"ලේකම් තනතුර (කොන්ත්‍රාත් පදනම)"** ලෙස සඳහන් කර තිබිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2025.10.23